# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

India's National Spiritual Newspaper ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

1969 to 2029 REACHING NATIONS ECHO OF HIS CALL SINCE 1969

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 AUGUST Issue No. 09


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 136:1-10)

1. ස්වාමීන්ට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
2. දෙවිවරුන්ගේ දෙවියන්ට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
3. ස්වාමිවරුන්ගේ ස්වාමීන්ට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
4. මහත් ආශ්චර්යයන් කරන එකම තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
5. නුවණින් අහස මැවූ තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේ කරුණාව සදාකල් පවත්නේය.
6. ජල මතුයෙහි පොළොව අතුලා වූ තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
7. මහත් ආලෝක මැවූ තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
8. දවාලෙහි ආණ්ඩුකිරීමට සූර්යයා මැවූ තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
9. රාත්‍රියේදී ආණ්ඩුකිරීමට සඳ සහ තාරකා මැවූ තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.
10. කුලුඳුලන් නැසීමෙන් මිසරයට පහරදුන් තැනැන්වහන්සේට ස්තුතිකරව්, මක්නිසාද උන්වහන්සේගේ කරුණාව සදාකල් පවත්නේය.



## ඔබව ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් හොඳ සොල්දාදුවකු වීමට කැඳවා ඇත !

## You are called to be a good SOLDIER FOR CHRIST!

(සහෝදරී ඒන්ජලින්)

උත්ථාන වූ රජකම්කරන්නා වූ සහ නැවත එන්නාවූ 'පැමිණෙන්නා වූ අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙන නමි!



සෑම ඉන්දියානු ජාතිකයෙකුටම අපගේ ප්‍රධාන නිර්මාතෘ වන පාස්ටර් එස්. සෑම් සෙල්ව රාජ්ගේද ඔහුගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ කාර්ය මණ්ඩලය සහ විශ්වාසවන්තව උපකාර කරන්නන් සියලු දෙනාගේම මෙම ප්‍රීතිමත් හා ආශීර්වාදලත් 80වන නිදහස් සැමරුමට හෘදයාංගමයෙන්ම උණුසුම් සුබ පැතුම් පිරිනමන්නෙමු!

මෙම ඓතිහාසික සන්ධිස්ථානය තුළින් අපට ආශීර්වාද කර නිදහස අගය කිරීමටත් අප අතර සමගියේ බැඳීම් ශක්තිමත් කිරීමටත් අපගේ ආදරණීය ජාතිය සඳහා දීප්තිමත් සාමකාමී සහ බලාපොරොත්තුවෙන් පූර්ණ වූ අනාගතයක් සඳහා එක්ව කටයුතු කිරීමට අපව පොළඹවන අතර ඒ ගැන අපට මතක් කර දෙයි.

අපගේ ජාතික නිදහස සමරන විටදී එම නිදහස වෙනුවෙන් තම ජීවිතය පරිත්‍යාගය කළ නිර්භීත පුරුෂයන් සහ කාන්තාවන්ගේ ගණන් කළ නොහැකි කැපකිරීම් හා ඔවුන් තුළ තිබූ නොසැලෙන ධෛර්යය කෙරෙහි අපගේ හදවත් කෘතඥතාවයෙන් පිරී යයි. එසේම ඔවුන්ගේ නොපසුබට උත්සාහය සහ නොසැලෙන කැපවීම, අපගේ නිදහස ගොඩනැගුවා වූ අත්තිවාරම බවට පත්විය. දශක අවසාන පමණ පෙර ජීවත් වූ අයගේ කැපකිරීම් අද අප භුක්ති විඳින නිදහස සඳහා ගෙවන ලද මිලය බවට පත්විය. ඔවුන්ගේ රුධිරය අප ජාතියේ නිදහසේ මල් පිපුණු බීජය බවට පත්විය.

3 වෙනි පිටුවට ...


Echo of His Call

Christian YouTube Channel!



Every day 2 minutes message by

Pr. S. Sam Selva Raj!

in English, Hindi Language - 1.00 A.M., in Tamil & Telugu Language - 2.00 A.M.

and

Tamil & English Message & Prayer

Sunday 8.30 A.M. & 6.00 P.M.

Please Subscribe if you are blessed! Share with whom you love & care!!

# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...



"නිර්දෝෂ මාර්ගයෙහි යන්නා වූ ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි හැසිරෙන්නා වූ තැනැත්තෝ භාග්‍යවන්තයෝය." (ගීතාවලිය119:1)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

EX MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

EDITORIAL BOARD
Sis. Sajini Cherian
Rev. Dr. J. John Rajarathnam, B.E.S., B.D., M.Th.
Rev. Dr. K.R. Rajasekaran
Adv. N. Balaji, B.Com., M.L.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293
Cell : (+91) 98410 71852, 98412 71858

E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

YOUTUBE CHANNEL
Echo of His Call

ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය මිතුවරුනි,

අපගේ ස්වාමින් සහ ගැලවුම්කාර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අනර්ඝ නාමයෙන් ඔබට සුබ පතමි!

අපගේ ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබට ආශිර්වාද කර ඇත. උන්වහන්සේ ඔබට මහිමාන්විත අනාගතයක් සඳහා නව දොරටු සහ අවස්ථාවන් විවෘත කරනු ඇත. අපි කරනවා වගේම, ඕනෑම අවස්ථාවකදී අපට උන්වහන්සේව විශ්වාස කළ හැකිය.

*"ජීවතුන්ගේ දේශයෙහි ස්වාමින් ඉදිරියෙහි හැසිරෙන්නෙමි." (ගීතාවලිය 116:9)*

ලබන වසරේ සිට 'Echo of His Call' සඟරාවේ එක් පිටපතක් සඳහා රුපියල් 2.00 ක (රුපියල් දෙකයි) තැපැල් ගාස්තුවක් ගෙවීමට සිදුවන බව අප දනිමු. මෙය අපගේ සේවාවට සැලකිය යුතු මූල්‍ය බරක් වනු ඇත. එම නිසා අපගේ සන්නිවේදන ඇමතිතුමාගේ සහ ගරු ඉන්දීය අගමැතිතුමාගේ හදවත් දෙවියන් වහන්සේ ඒ සඳහා පොළඹවන ලෙස යාච්ඤා කරන මෙන් අප ඔබගෙන් ඉතා නිහතමානීව ඉල්ලා සිටිමු. අපගේ ගරු අගමැතිතුමා සහ ඔහුගේ කණ්ඩායමට යහපත් සෞඛ්‍යයක්ද, ප්‍රඥාව සහ දීර්ඝායුෂ ලබා දෙමින්, දෙවියන් වහන්සේගේ ආශිර්වාදයද ලබා දෙන්නය කියා යාච්ඤා කරන්න.

2026 ජූලි මස 4වන දින පැවති අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලේ 26 වන උපාධි ප්‍රධානෝත්සවයට දෙවියන්වහන්සේගේ කරුණාවෙන් ආශිර්වය ලැබුණේය. සිසුන් 35 දෙනෙක් එයට ඇතුළත් විය.



*අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ 26 වන උපාධි ප්‍රධානෝත්සවය.*

ඔවුන් උපාධිය ලබා දෙවියන්වහන්සේගේ මහිමාන්විත දේව සේවය සඳහා වෙන්කරන ලදී. දැන් ඔවුන් ඉවෙන්ජලිස්තවරුන්, දේව ගැතිවරුන් ලෙස කිතුණු දේව සේවය සඳහා නොයෙකුත් පළාත්වල මිෂනාරි සේවය සඳහා යවා ඇත.

දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකුවූ සුභාරංචියේ විශිෂ්ට දේශකයෙකු සහ කැදවීමේ ප්‍රතිරාවය සේවයෙහි මලයාලම්හි සහකාර කර්තෘවරයකු වන ඉවැන්ජලිස්ත බෙන්ජමින් මෝසෙස් ද ඔහුගේ ආදරණීය බිරිඳ වන ප්‍රමිලා බෙන්ජමින් මහත්මිය සහ ඔහුගේ දියණිය වන මහිමා බෙන්ජමින් සමගින් අපගේ ප්‍රධාන කාර්යාලයට

පැමිණ අප සමඟ ආශිර්වාදලත් සහභාගිකමේ කාලයක් ගත කළේය. අපි ඔවුන් වෙනුවෙන් දෙවියන්ට බොහෝ සෙයින් ස්තුතිවන්ත වෙමු.



*ඉවැන්ජලිස්ත මෝසස්, සහකාර සර්තෘ (මලයාලම්) සහ පවුල*

ඉන්දියාවෙහි බිලියන 1.5 කට ආසන්න ජනගහනයක් සිටින ජ්‍යෙෂ්ඨ ප්‍රජාතන්ත්‍රවාදී ජාතියකි. සංඛ්‍යා ලේඛනවලින් පෙනී යන්නේ; කිතුනුවන් ජනගහනයෙන් සියයට 2ක් පමණ වන බවයි. එබැවින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය අප අතර සිටින ළඟා නොවූ අයට ළඟා වීමට අපට දැවැන්ත වගකීමක් තිබේ.

ඔබ මෙම පණිවිඩය කියවන විටදී; ස්වාමීන් වහන්සේ ඔබගේ හදවතට කතා කරමින් මෙම දේව සේවයට කැපවීමට ඔබව යොමු කරන්නේ නම්, උන්වහන්සේගේ මඟ පෙන්වීම අනුව එසේ කිරීමට අපි ඔබව දිරිමත් කරමු. කරුණාකර ඔබගේ යාඥාවලදී මෙම ප්‍රාදේශීය දේව ගැත්තරුන් සහ දේව සේවකයින් උදෙසා ද යාච්ඤා කරන්න සහ ස්වාමීන්වහන්සේ ඔබට බලය ලබාදෙන පරිදි ඔවුන්ට සහාය වන්න.

*''එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කතාකොට ගොයම නම් බොහෝය, නමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය එබැවින් තමන් ගොයම් කැපීමට ගොවියන් එවන ලෙස ගොයමේ ස්වාමියාට යාඥා කරපල්ලා යයි කී සේක.'' (මතෙව් 9:37-38)*

*In Christ Jesus, your servant,* **Pr. S. Sam Selva Raj**
E.mail : sam@echoofhiscall.org

*1 පිටුවෙන්....*

මෙය අපට මතක්කර දෙන්නේ මීට වසර 2000කට පමණ පෙර කල්වාරි කුරුසියේ අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පූජාව ඊටත් වඩා ශ්‍රේෂ්ඨ පූජාවක් බවයි. උන්වහන්සේගේ අමිල රුධිරය; අපගේ පාපයෙන් මිදීම සඳහා ඉතා උසස් හා සදාකාලික නිදහසක් ලබා දුන්නේය. එසේම විවිධ රෝගී තත්ත්වයන්ගෙන්, නොයෙකුත් ඇබ්බැහිවීම් වලින්, අධ්‍යාත්මික වහල් භාවයන් සහ පරම්පරාගත ශාපයන්ගෙන් නිදහස ලබා දුන්නේය.

දේව වචනය මෙසේ ප්‍රකාශ කරයි;

*''ඔහු ශාපයක් බවට පත් විය'' (ගලාති 5:13)*

උන්වහන්සේගේ කුරුස පූජාව තුළින් අපව අන්ධකාරයෙන් මුදවාගෙන, යේසුස් ක්‍රිස්තුස්වහන්සේවම ප්‍රකාශ කරනු ලැබුවේ; උන්වහන්සේගේ පුදුමාකාර ආලෝකයට අපව ගෙනවිත් තිබෙන බවයි.

*''නුඹලා සැබෑව දැනගන්නවා ඇත. සැබෑවද නුඹලා නිදහස් කරන්නේය.''(යොහාන් 8:32)*

දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා - යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ අප සැබවින්ම නිදහස්ය!

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ කුණාටුව:**

මාර්ක් 4වන පරිච්ඡේදයෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් දරුණු කුණාටුවකට මුහුණ දුන් අවස්ථාවේදී උන්වහන්සේ ඔරුවේහි නිදා ගෙන සිටි බව අප දේව වචනය තුළින් කියවමු. ඔවුන් බියෙන් මුසපත්වෙමින් උන්වහන්සේව අවදි කරවන පිණිස ඉතා මහත් හඬින් කෑ ගැසුවේය.

*''........ ආචාර්යනි, අප විනාශ බව ඔබ සළකන්නේ නැද්ද ...'' (මාර්ක් 4:4)*

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැගිට සුළඟට සහ මුහුදට තරවටු කළ අතර පසුව උන්වහන්සේ තම ගෝලයන්ට ඔවුන්ගේ ඇදහිල්ල සම්බන්ධයෙන් අභියෝග කළේය. මැවිල්ල කෙරෙහි උන්වහන්සේගේ පරම ආධිපත්‍යය දුටු විට ඔවුන් භීතියෙන් පිරී ගියහ.

මාර්ක් 4:36 හි මෙසේ පවසයි:

*''උන්වහන්සේ සිටි ලෙසම ඔරුවේ තමුන් සමඟ උන්වහන්සේ ගෙන ගියෝය ......''*

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නොකඩවාම දේව සේවයෙහි යෙදී සිටි සේක. උන්වහන්සේ ශාරීරික ලෙස හා චිත්තවේගීය වශයෙන් වෙහෙසට පත්ව සිටි අතර සමූහයාගෙන් වෙන් වී මොහොතක් විවේක ගැනීමට අවශ්‍ය විය - තම ගෝලයන් සමඟ නිහඬ කාලයක් ගත කරන පිණිස.

ඔවුන් උන්වහන්සේව රැගෙන යනු ලැබුවේ, උන්වහන්සේ ඉතාම වෙහෙසට පත්ව නින්දක් අවශ්‍යව සිටිය විටදීය. ඔවුන් බෝට්ටුවේ ගමන ආරම්භ කළ විටදීම; යේසුස් වහන්සේ නින්දට වැටුණේය.

අප අතරින් බොහෝ දෙනෙකුට මෙය තේරුම් ගැනීමට හැකිය. දිගු දිනක වෙහෙස, දේවසේවය, වගකීම් හෝ සේවයෙන් පසු, අපි නිහඬ ස්ථානයක් සොයා ගත් මොහොතේම, වෙහෙස අපව අල්ලා ගනී.

එහෙත් මෙම පදය තුළම, බොහෝවිට නොසලකා හරින කුඩා නමුත් වැදගත් විස්තරයක් ඇත. එය ගැඹුරු අධ්‍යාත්මික හෙළිදරව්වකට ගෙනයයි.

*''තවද උන්වහන්සේ සමඟ තවත් කුඩා ඔරුද තිබුණි.''*

මෙම විස්තරය මාර්ක් තුමාගේ ශුභාරංචියෙහි පමණක් වාර්තා කරයි. මාර්ක්ගේ ශුභාරංචියේ බොහෝ සිදැසින් දුටු සාක්ෂිකරුවන්ගේ විස්තර අඩංගු වන අතර, ධීවරයෙකු සහ

ජේසුස්වහන්සේගේ සමීපතම ගෝලයෙකු වූ පේතෘස්ගේ බලපෑමෙන් ඒවා ආභාෂය ලැබූ බව විශ්වාස කෙරේ.

මාර්ක් අද්විතීය ලෙස විස්තර කීපයක් වාර්තාකරයි. ඒවා නම්;

- ★ යේසුස්වහන්සේ මෙත්තය මත නිදා ගෙන සිටීම. (මාර්ක් 4:38)
- ★ පන්දහසකට කෑම දුන් අවස්ථාවේ තිබූ කොළපැහැති තණකොළ. (මාර්ක් 6:39)
- ★ සිය දෙනකුගෙන් සහ පනස් දෙනකුගෙන් යුත් කණ්ඩායම් (මාර්ක් 6:40)
- ★ අන්ධ මිනිසාව පියවර දෙකකින් සුව කිරීම. (මාර්ක් 8:22-25)

එබැවින්, මාර්ක් තුමා; කුඩා බෝට්ටුව ඔහු සමග සිටන විට කියා ලියනු ලබයි. එය අනවශ්‍ය විස්තරයක් නොව, එය බලවත් අධ්‍යාත්මික සත්‍යයක් හෙළි කරයි.

ඔබේ ජීවිතය නිරීක්ෂණය කරනු ලැබේ. ඔබේ කුණාටු නිරීක්ෂණය කරනු ලැබේ. ඔබේ ගැලවීම පිළිබඳ සාක්ෂිය වෙනත් කෙනෙකුට නිදහස සඳහා දොරටුවක් විය හැකිය. මා සිතන්නේ; කුණාටුව මැද්දේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පසුපස ගිය කුඩා බෝට්ටු දෙවියන් වහන්සේ යැයි කියා සිතමි.

## කුඩා බෝට්ටු අපට මතක් කර දෙන්නේ කුමක්ද?

### 1). මතක තබාගන්න:

ඔබ දෙස බලා සිටින කුඩා බෝට්ටු වලින් ඔබ වටවී ඇත. දෙවියන්වහන්සේ අපව කැඳවා ඇත්තේ උන්වහන්සේගේ ප්‍රශංසා ප්‍රකාශ කිරීමටයි.

*''නමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවා කැඳවාගත් තැනැත්වහන්සේගේ උත්කෘෂ්ඨභාවයන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධ වූ ජාතියක්ද දෙවියන් වහන්සේ සන්තක සෙනගක්ද වන්නහුය." (1 පේතෘස් 2:9)*

අපට ක්‍රිස්තුස් වහන්සේ තුළ නිදහස ලැබී ඇත්තේ එය අප වෙනුවෙන් පමණක් නොව, උන්වහන්සේගේ ආලෝකය අපගේ ජීවිත තුළින් බැබළෙන අතර අන් අය උන්වහන්සේ වෙතට යොමු කරනු ඇත.

අප එය තේරුම් ගත්තත් නැතත් මිනිසුන් අපගේ ඇඳහිල්ල, අපගේ ආකල්ප, අපගේ වචන, අපගේ ක්‍රියාවන්, කුණාටු මධ්‍යයේදී අපගේ ප්‍රතිචාර සහ අප හැසිරෙන ආකාරය දෙස බලා සිටියි.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ පැවසීය;**

*"එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබලාවා.'' (මතෙව් 5:16)*

කුණාටු මධ්‍යයේ වුවද, අපගේ ජීවිතය තුළින් දෙවියන් වහන්සේගේ යහපත්කම හෙළි කර, අන් අය ස්වර්ගයේ සිටින අපගේ පියාණන්ව මහිමයට පත් කිරීමට එය හේතු වේවා.

එම කුඩා බෝට්ටු යේසුස්වහන්සේගේ බෝට්ටුව පසුපස ගමන් කළේ මන්දැයි කියා මම නොදනිමි.

නමුත් සමහර විටදී එය:

- ★ සමහරු කුතුහලයෙන් යුතුව පසුපස ගමන් කළේය.
- ★ සමහරු ඔහුගේ ක්‍රියාව ගැන මවිත වූ නිසා ඔහු පසුපස ගියහ.
- ★ සමහරු නිරීක්ෂණය කිරීමට සහ විවේචනය කිරීමට අනුගමනය කළහ.
- ★ සමහරු වචනයට තිබුණු කුසගින්න නිසා උන්වහන්සේව අනුගමනය කළේය.
- ★ තවත් සමහර ධීවරයින් සහ සංචාරකයින් වැනි අයද ඒ අසල සිටියේය.

ඔවුන්ගේ කාරණාව කුමක් වුවත් කුණාටුව පැමිණි විටදී ගෝලයින් ප්‍රතිචාරය දැක්වූ ආකාරයට ඔවුන් සාක්ෂිකරුවන් විය.

**අප වටා තිබෙන මෙම කුඩා බෝට්ටු කවුද?**

- ★ අපගේ දරුවන්
- ★ අපගේ සහකරුවා
- ★ අපගේ පවුලේ සාමාජිකයන්
- ★ අපගේ සගයින්
- ★ අපගේ අසල්වැසියන්
- ★ අපගේ සභා පවුල
- ★ අපගේ ප්‍රජාව

ඔබ ජීවිතය නම් ගමනේ තනිවම යාත්‍රා කරන්නේ නැත. ඔබට සමාන්තරව යාත්‍රා කරන කුඩා යාත්‍රා ද තිබේ; ඒවා ඔබේ ගමන දෙස බලා සිටී.

....Contd. to page 6





ඉතා හදිසි දැනුම් දීමක්!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: sam@echoofhiscall.org

ඉදිරියේදී තැපැල් ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1986

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අගෝ:19** - කැදවීමේ ප්‍රතිරාවය සේවයට බොහෝ දෙනාගේ ආශිර්වාදය ලබා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:20**- අපගේ නෙහිමියා බයිබල් විද්‍යාලයේ සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:21** - අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ විදුහල්පති තුමා, කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින්ට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:22**- 2026 අගෝස්තු 10 වන දින පවත්වන ලද අපගේ 57 වන සන්වත්සරය සැමරීමට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:23** - අපගේ මිෂනාරි සේවකයින්ගේ මහත් කැපවීමේ සේවය නිසා, ස්තුති කරන්න.

**අගෝ:24**- අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමා සහ ඔහුගේ පවුලේ අයට දෙවියන්වහන්සේගේ කරුණාව ලබාදී තිබෙන නිසා, නිසා ස්තුති කරන්න.

**අගෝ:25**- පසුගිය මාසය තුළ අපගේ සියළුම අවශ්‍යතා සපයමින් අපගේ සභාවට නව සාමාජිකයින් එකතු කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:26**- අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, ජීවිතය කාලය පුරා හවුල්කරුවන් සහ මහා ආ මහා ආච්ඤා පේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් වලට දෙවියන් වහන්සේගේ කරුණාව ලබාදී තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:27**- 2926 -2027 යන අධ්‍යයන වර්ෂයේ සඳහා ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නව සිසුන් ඇතුළත් කර තිබෙන නිසා, ස්තුති කරන්න

**අගෝ:28**- අපගේ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්ද අපට ද්‍රව්‍යමය සහ මූල්‍ය වශයෙන් සහාය දෙන සියලු දෙනාට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න

**අගෝ:29** - කැඳවීමේ ප්‍රතිරාවය සතරා සේවයට විශ්වාසවන්තව සහාය දක්වමින් කැප වූ සහකාර සංස්කරුවන්ගේ සේවයටත් සෑම සේවයකටම උපකාර කරන සේවකයින්ටත් ආශිර්වාද කර තිබෙන නිසා, ස්තුති කරන්න.

**අගෝ:30**- ශ්‍රී ලංකාදේශය තුළ සිටින සියලුම දේව දාස, දාසීන්ට සහ දේව දරුවන්ට දෙවියන්වහන්සේගේ කරුණාව ලබාදී තිබෙන නිසා, ස්තුති කරන්න,

**අගෝ:31**- ශ්‍රී ලංකා දේශයේ සියලුම කිතුණු නිකායන් වලට එක්සිත්ව වැඩ කිරීමට දී තිබෙන කරුණාව නිසා, ස්තුති කරන්න;

**සැප්:01**- ශ්‍රී ලංකාදේශය තුළ බාධාවකින් තොරව සුභ ආරංචිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**සැප්:02** ලෝකයේ බොහෝ රටවල්වලට බාධා මධ්‍යයේ වුවද සුභාරංචිය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

**සැප්:03**- ලෝක මිෂනාරි සේවයට දේවදාස දාසීන් නැගිටුවා දී තිබෙන නිසා, ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**සැප්:04**- මෙම මාසය තුළදී දෙවියන් වහන්සේ අපගේ සියළුම අවශ්‍යතා සපුරාලන පිණිස, පිණිස යාච්ඤා කරන්න.

**සැප්:05**- 2026 -2027 වන අධ්‍යයන වර්ෂ තුළ අපගේ නෙහෙමියා බයිබල් විදුහලේ සහ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ සියලුම සිසුන් උදෙසා, යාච්ඤා කරන්න.

**සැප්:06**- අපගේ රාජ්‍ය සම්බන්ධීකාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කරන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:07**- ඉන්දියාව තුළ සිටින්නා වූ ළඟා නොවූ ප්‍රදේශවලට ශුභාරංචිය ගෙන යාමට අපට හැකියාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:08**- අපගේ මුද්‍රණාලයේ මුද්‍රණකරු, සහකාර මුද්‍රණකරු, මුද්‍රණාලයේ සියලුම කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් උදෙසා සහ අපගේ සියලුම සේවාවන්වල කටයුතු යහපත් ලෙස ඉදිරියට කරගෙන යන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:09**- ලොව පුරා සිටින දරුවන්ට සහ කාන්තාවන්ට සිදුවන සියලුම හිංසනයන්ගෙන් ආරක්ෂාව වන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:10**- ලොව පුරා මත්පැන් පානය කිරීමට හා නොයෙකුත් දුෂ්ට ක්‍රියාවන් වලට ඇබ්බැහි වී සිටින්නන් පසුතැවිලි වී ස්වාමීන් වහන්සේ තුළට පැමිණෙන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:11** - ලෝකවාසී සියලු ජනතාව හා රටවල් අතර සාමය සහ සමගිය ඇතිවන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:12**- සියලුම නිකායන්ට අයත් කිතුනු දේශකයින් ශුභාරංචිය; දේව වචනයට එකගව හා විශ්වාසවන්තව ප්‍රකාශ කරන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:13** - ලොව පුරා තිබෙන සියලුම කිතුණු සංවිධාන සහ සභාවන් කෙරෙහි දෙවියන් වහන්සේගේ ආරක්ෂාව සහ ආශිර්වාදය වැගිරෙන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:14**- බන්ධනාගාරවල සේවය කරන සියලුම නිලධාරීන්ට සහ එහි සිටින සියලුම මිනුෂයයන්ට දෙවියන් වහන්සේගේ කරුණාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:15**-- අපගේ ප්‍රධාන දේවගැති එස්.සැම් සෙල්වරාජ්ට දෙවියන් වහන්සේගේ අලුත් දර්ශනයක් ලැබෙන පිණිස සහ ඔහුගේ පවුලේ සියලු දෙනා සියලු නපුරෙන් ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:16**-- ශ්‍රී ලංකා දේශය තුළ පවතින්නා වූ සියලුම වසංගත රෝග සහ ඩෙංගු රෝගයෙන් මිනුෂයයන්ට සුවය හා ආරක්ෂා ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:17**-- ශ්‍රී ලංකා දේශය තුළ සමහර කිතුණු නිකායන්හි වැරදි ඉගැන්වීම් වලින් මිනුෂයන්ව ආරක්ෂා කරන පිණිස, යාච්ඤා කරන්න.

**සැප්:18**-- ලොව පුරා සේවය කරන සියලු මිෂනාරිවරුන්ට දෙවියන්වහන්සේගේ ආරක්ෂාව හා සියලු මිනුෂයයන් පසුතැවිලි වී දෙවියන් වහන්සේ වෙතට හැරෙන පිණිස, යාච්ඤා කරන්න.

....Contd. from page 4

## 2). මතක තබාගන්න: යේසුස්වහන්සේ ඔබව ඔසවාගෙන යයි - ඔවුන් එසේ නොකරයි :

ගෝලයින් සිටි ඔරුව සහ කුඩා ඔරු අතර තිබූ ලොකුම වෙනස කුණාටුව නොව යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමයි. කුඩා බෝට්ටු එකම ජලයෙහි තිබූ අතර ඒවා කුණාටුවට මුහුණ දුන්න නමුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ බෝට්ටුවේ සිටියේ නැත.

කෙසේ වෙතත් අප කොයේ ගමන් කරනු ලැබුවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපව උසුලාගෙන යයි. අප ශුද්ධාත්මයාන් වහන්සේගේ මාලිගාවයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අභිමුඛත්වයත් අප සමග තිබේ.

අප වටා සිටින බොහෝ අය තවමත් උන්වහන්සේගෙන් වෙන්ව ජීවත් වෙයි. - බිය, ව්‍යාකූලත්වය, බලාපොරොත්තු සුන්වීම, අධ්‍යාත්මික වහල්භාවය සහ පාපයේ දම්වැල්වලින් සිරවී සිටිති. යේසුස් ක්‍රිස්තුස් වහන්සේව උසුලාගෙන යන අප ප්‍රතිචාර දක්වන ආකාරය සහ ජීවත් වන ආකාරය ඔවුන් බලා සිටිති.

**යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේය;**

*"ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක් නිසාද දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක; වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද, මඩිනා ලද්දවුන් නිදහස් කර හරින්ටද; " (ලූක් 4:18)*

මෙය මතක තබා ගන්න; ඔබ නිදහසේ නාගාපතිවරයෙකි.

දෙවියන්වහන්සේ ඔබව නිදහස් කර ඇත්තේ, ඔබ අවට තිබෙන කුඩා බෝට්ටුවලට උන්වහන්සේගේ නිදහසේ නාලිකාවක් වීමට හැකිවන පිණිසය.

ඔබගේ බෝට්ටුවේ සිටියේ කවුද සහ එහි නැත්තේ කවුද යන්න ඔබට කිසිදා අමතක වන්නේ නැත. ඔබගේ ජීවිතය යනු; මිනිසුන් දැනටමත් කියවන පණිවිඩයකි.

**ඔබ දේශනා කරන්නා වූ පණිවිඩය කුමක්ද?**

## 3). මතක තබාගන්න:

කුණාටුව සෑම බෝට්ටුවකටම බලපායි.

කුණාටුව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගමන් කළ බෝට්ටුවට පමණක් නොව ජලයෙහි තිබූ සෑම බෝට්ටුවකටම බලපෑවේය.

ඇදහිලිවන්තයින් සහ නොඇදහිලිවන්තයින් යන කණ්ඩායම් දෙකටම මෙම කුණාටුවට මුහුණ දීමට සිදු වුවේය.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බෝට්ටුව තුළ සිටීමෙන් අදහස් කරන්නේ අපට කිසිදා කුණාටු වලට මුහුණ දීමට සිදු නොවන බව නොවේය. නමුත් එහි තේරුම සෑම විටම වඩා ශ්‍රේෂ්ඨ ගැලවුම්කරුවෙකු අපට සිටින බවයි.

කුණාටු අප වෙත පැමිණිය හැකිය:

- ★ චිත්තවේගීය සටන්
- ★ මූල්‍යමය අවශ්‍යතා
- ★ පවුලේ අරගල
- ★ සෞඛ්‍ය අභියෝග
- ★ අධ්‍යාත්මික ප්‍රහාර

සතුරා කුණාටු යොදා ගන්නේ අපගේම වේදනා කෙරෙහි පමණක් අවධානය යොමු කර, අප වටා ඇති කුඩා බෝට්ටු අමතක කර දැමීමටයි. යක්ෂයා නිතරම කැමති වන්නේ අපව යටපත් කර තැබීමටයි.

- ★ කාන්තාව සහ චිත්තවේගීය බර
- ★ පවුලේ වෙන්වීම්
- ★ මූල්‍යමය දුෂ්කරතා
- ★ශාරීරික දුර්වලතාවයන්

අප අපගේම අරගල වලින් සම්පූර්ණයෙන්ම ගිලී සිය විට අපගේ යාච්ඥාන්, දිරිගැන්වීම්, අනුකම්පාව සහ සාක්ෂිය අවශ්‍ය අයව දැකීමට අප අසමත් වෙමු.

නමුත් දෙවියන් වහන්සේ අපට කුණාටුවෙන් ඉහළට නැගී සිටීමට ආරාධනා කරයි.

**යෙසායා 40:31 හි මෙසේ පවසයි:**

"නමුත් ස්වාමීන් වහන්සේ ගැන බලා සිටින්නෝ තමුන්ගේ සවිය අලුත් කරගන්නෝය; ඔවුහු රාජාලීන් මෙන් පියාපත් නගින්නෝය; ඔවුහු දුවන්නෝය, එහෙත් වෙහෙස නොවෙති; ඔවුහු ඇවිදින්නෝය, එහෙත් ක්ලාන්ත නොවෙති."

ඔබට දරා ගත නොහැකි තරම් බරක් උසුලාගෙන, මිදීමට උත්සාහ කරමින්, හුදකලා වූ නිම්නයක් හරහා ගමන් කරමින් සිටිනවාක් මෙන් දැනෙන්නට පුළුවන.

එහෙත් ඔබව කැඳවූ දෙවියන් වහන්සේ විශ්වාසවන්තව සිටියි. අද ඔබ මුහුණ දෙන්නා වූ කුණාටුව, ඔබේ ගමන ගැන බලා සිටින්නා වූ ගණන් කළ නොහැකි කුඩා බෝට්ටු වලට බලාපොරොත්තුව සහ නිදහස ගෙනදෙන සාක්ෂියක් බවට පත්විය හැකිය. ඔබ දැන් අත්විඳින සටහම ඔබ කිසිදාක නොදන්නාවූ අයට පවා ආශීර්වාදයක් බවට පරිවර්තනය විය හැකිය.

### ධෛර්යමත් වන්න

ඔබේ බෝට්ටුවේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සිටීම යන්නෙහි තේරුම කුඩා බෝට්ටු වලට පෙන්වන්න.

## 4). කුණාටුවේදී ඔබ දක්වන ප්‍රතිචාරය කුඩා බෝට්ටු වලට බලපෑමක් ඇති කරයි

ගෝලයින් භීතියට පත් වී කෑගැසුවේය, "ආචාර්ය, අප විනාශ වෙන්න යනවා ..... ඔබට එයින් කමක් නැද්ද?" ඔවුන් වටා තිබූ කුඩා බෝට්ටු ද බියෙන් පිරී යන්නට ඇත.

යේසුස් වහන්සේ රැගෙන ගිය බෝට්ටුව වෙව්ලමින් සිටියා නම්; අනෙක් අයට තිබුණේ කුමන බලාපොරොත්තුවක්ද?

අර්බුදකාරී අවස්ථාවකදී ඔබේ ප්‍රතිචාරය, බොහෝවිට සැනසිලිදායක අවස්ථාවලදී ඔබේ වචන වලට වඩා ශබ්ද නගා කතා කරයි.

ඔබ ප්‍රතිචාර දක්වන්නේ බලාපොරොත්තුවක් නැති අය මෙන්ද? නැතිනම් කුණාටුවේදී ඔබ සමග සිටින හැනැත්තාව ප්‍රකාශ කරනවාද?

හෙබ්‍රෙව් තරුණයන් තිදෙනෙක් මෙසේ ප්‍රකාශ කළේය;

*"අප සේවය කරන අපගේ දෙවියන් වහන්සේට අපව ගලවා ගැනීමට හැකිය ......... නමුත් උන්වහන්සේ එසේ නොකළත් " (දානියෙල් 3:17-18)*

මෙය ඇදහිල්ලේ කෙතරම් බලවත් ප්‍රකාශනයක්ද?

ඔබ එසේකළත් තමන් මුහුණ දෙන්නා වූ තත්ත්වයන් මත පමණක් රඳා නො පවතින එවැනි ඇදහිල්ලක් අපට තිබේද? දුර සිට බලා සිටින සෑම කුඩා බෝට්ටුවක්ම ශක්තිමත් කරන ඇදහිල්ලක් අපට තිබේද?

පාවුලු තුමා මෙසේ ප්‍රකාශකළේය:

*"...... මක්නිසාද මා විසින් අදහා ගත් තැනැත් වහන්සේ කවුද කියා මම දැනගෙන ..... සිටිමි."*
*(2 තිමෝති 1:12)*

කුණාටුවක් මැද ඔබ තුළ ඇති විශ්වාසය, වෙනත් කෙනෙකුට ශක්තියක් විය හැකිය.

## 5). මතක තබාගන්නः කුඩා බෝට්ටු ඔබගේ ගැලවීම මත රඳා පවතී.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුණාටුව සන්සුන් කල විට උන්වහන්සේ වටා සිටි සැම කුඩා බෝට්ටුවක්ම උන්වහන්සේගේ බලයේ බලපෑම් අත්විඳින ලදී. මෙම ප්‍රාතිහාර්ය ගෝලයන්ට පමණක් නොව අසල තිබූ සැම බෝට්ටුවකම සිටි සියල්ලන්ටම සාමය ගෙන ආවේය.

ආදරණීය සහෝදර සහෝදරියනි, සමහර විට දෙවියන් වහන්සේ අපට නොයෙකුත් දුෂ්කරතාවයන්, කුණාටු, පරීක්ෂාවන් සහ අනපේක්ෂිත කාලවල් හරහා ගමන් කිරීමට ඉඩ සලසන්නේ අපගේ ගැලවීම අන් අයට බලාපොරොත්තුවක් ගෙන ඒමට උන්වහන්සේ අදහස් කරන බැවිනි. ඔබගේ ඉදිරි ගමන වෙනත් කෙනෙකුගේ ආශිර්වාදයක් විය හැකිය.

ඔබගේ යාච්ඤාව තවත් පුද්ගලයෙකුට දොරටුවක් විවර කළ හැකිය. ඔබගේ නොපසුබට උත්සාහය නිහඬව අරගල කරන කෙනෙකුට ශක්තියක් විය හැකිය.

සමහර විට දෙවියන් වහන්සේ අපට කුණාටු හරහා යාමට ඉඩ දෙනු ලබන්නේ; එමගින් අපගේ සාක්ෂිය තවත් පුද්ගලයෙකුගේ නිදහසට යන මාවතක් බවට පත් කරන පිණිසයි.

පාවුළු සහ සීලස්ව මතකයට ගෙන එන්න. ඔවුන්ව සිරගතකර දම්වැල් වලින් බැඳ තැබූ විටදී ඔවුන් බලාපොරොත්තු සුන් වීමට යටත් වූයේ නැත. ඒ වෙනුවට ඔවුන් නමස්කාර කරමින් තම හඬ අවදි කළේය.
දේව වචනයෙහි මෙසේ පවසයි:
*"නුමුත් මධ්‍යම රාත්‍රිය පමණේදී පාවුල්ද සීලස් ද යාච්ඤා කරමින් දෙවියන් වහන්සේට ගී කීවෝය. හිරකාරයෝ ද ඔවුන්ට ඇහුම්කන්දීගෙන සිටියෝය." ( ක්‍රියා 16:26)*

"මගේ ආදරණීය සහෝදර සහෝදරියනි,
"සියල්ලෝම" යන වචනය සැලකිල්ලට ගන්නः

පාවුල් සහ සීලස් පමණක් නොව සැම කෙනෙකුටම ඔවුන්ගේ නිදහස ලැබුණි.

දෙවියන් වහන්සේගේ සේවකයන් දෙදෙනෙකු දුක් වේදනා මධ්‍යයේ නමස්කාරය තෝරා ගත් නිසා, ඔවුන් අසල සිටි දන්නා සහ නොදන්නා සිරකරුවන් නිදහස අත්විඳ ඇත.

ඒ දෙවියන් වහන්සේගේ කරුණාවේ බලයයි.

ඔබගේ නමස්කාරය ඔබට නැවත කිසිදා නොපෙනෙන දම්වැල් විවෘත කරන යතුර බවට පත්විය හැකිය. ආමෙන්!

## සැමට නිදහස

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අප සැම කෙනෙකුම කැඳවා ඇත්තේ උන්වහන්සේගේ නිදහසේ උපකරණ බවට පත්වීමටයි - සතුරාගේ උපක්‍රමවලින් - රැවටීම, බිය සහ අන්ධකාරයෙන් බැඳී සිටින අය වෙත ළඟා වීමට. කුඩා බෝට්ටු තවමත් අප වටා ඇත. ඔවුන් බලාපොරොත්තුව සොයමින් සිටිති. ඔවුන් සාමය ආශා කරති.

ඔවුන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ යථාර්ථය දැකීමට බලා සිටිති. ඔබ සහ මම ඔවුන්ට හමුවන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේම ප්‍රතිබිම්බය විය හැකිය.

ඔබේම බෝට්ටුවේ පමණක් ජේසු ක්‍රිස්තුන් වහන්සේ සිටීමෙන් සෑහීමකට පත් නොවන්න. ඔබ වටා ඇති කුඩා බෝට්ටුවලට ද ඔහු අවශ්‍ය වේ.

අප වටා සිටින මිලියන සංඛ්‍යාත ජනතාවට උන්වහන්සේගේ නිදහස ගෙන යාමට දෙවියන් වහන්සේ අපට හැකියාව ලබා දෙනු ඇත - ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට සදාකාලය මුණගැසෙන්නේ නැත. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම නොමැතිව යාත්‍රා කරමින් තිබෙන කුඩා බෝට්ටුවල සිටින අයගේ සැබෑ නිදහස් සටන්කරුවන් වීමට දෙවියන්වහන්සේ තවමත් අපව කැඳවා ඇත.

**කඩා බෝට්ට මතක තබා ගන්න!**

******************

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for Admission!
Medium : Tamil (Part Time)
Hindi (Part Time)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 56 years
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## "ඔබට සිය ගුණයකින් පූර්ණ වූ සදාකාලික ජීවිතය උරුම වනු ඇත !

*"ඔබට සිය ගුණයකින් පූර්ණ වූ සදාකාලික ජීවිතය උරුම වනු ඇත !*

*"කරන්ට නුඹේ අතට සම්බවෙන සියල්ලම නුඹේ වීර්යයෙන් කරපන්න; ................"*
*(දේශනාකාරයා 9:10)*

*"හුළඟ බලා සිටින්නා නොවපුරන්නේය; වලාකුළ් බලන්නා කපා නොගන්නේය.*
*(දේශනාකාරයා 11:4)*

තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව සහ බයිබල් විද්‍යාලය හරහා ජීවිතයේ සෑම තරාතිරමකම සිටින අයට බයිබලයේ ගැඹුරු සත්‍යතාවයන් ඉගැන්වීම මගේ බලවත් ආශාව වී තිබුණි. මෙම බර මගේ හදවතේ ගැඹුරින් මුල්බැස තිබූ අතර වසර ගණනාවක් පුරා එය ශක්තිමත්ව පැවතුණි. කෙසේ වෙතත් මටම කියා ස්ථිර ආදායම් මාර්ගයක් හෝ මෙම දර්ශනය තුළ මට මග පෙන්වීමට සහ සහය දීමට කිසිවෙකු නොමැති බැවින් මම අසරණ වූ බව මටම පෙනී ගියේය.



එම කාලය තුළ මගේ පවුලේ අය සහ මම දිළිඳුකමින් ජීවත් වූ අතර ඉතා සුළු පහසුකම් සහිත කුඩා නිවසක



විශාල දුෂ්කරතාවයන් විඳ දරාගෙන ගමන් කළෙමු. 1980 දී, මට ඉන්දියා බයිබල් සාහිත්‍යය (IBL) නම් සංවිධානයකින් ශුභාරංචි ඇසුරුමක් ලැබුණි. එය විවෘත කළ විට, මට ශුභාරංචි පත්‍රිකා කිහිපයක් සහ තැපැල් මාර්ගික බයිබල් පාඨමාලා පොත් එංචක් හමු විය. මම ඒවා කියවන විට, ඉන්දියාව පුරා සිටින ජනතාව වෙත විවිධ භාෂාවලින් ළඟා වීමට අවශ්‍ය ද්‍රව්‍ය භාවිතා කිරීමට මම දැඩි උනන්දුවක් දැක්වුවෙමි. ප්‍රමාදයකින් තොරව, මම මගේ පැරණි බයිසිකලයෙන් වෙන්නායි, thousand Light, ඉන්දියා බයිබල් සාහිත්‍ය කාර්යාලයට ගියෙමි.

එහිදී මට වෙච්ච මහතා මුණගැසුනේය. ඔහු දැන් විධායක අධ්‍යක්ෂක ලෙස සේවය කරන වේලායුදම් මහතා ලෙස හඳුන්වයි. ඔහු තැපැල් මාර්ගික පාඨමාලා පොත් යැවීමට එය ඉතා ප්‍රවේශමෙන් ඇසුරුම් කරන ආකාරය හැරඹීමෙන් දෙවියන්වහන්සේගේ මහිමය සඳහා ඒ හා සමාන කාර්යයන් කිරීමට මා තුළ මහත් පෙළඹීමක් ඇතිවිය.

මම ඔහු වෙතට ගොස් ඉතා ගෞරවයෙන් යුතුව කතා කරමින් මට එම පාඨමාලා පොත් කීපයක් ලබා දෙන්නට පුළුවන්ද කියා ඇසුවෙමි. එම පොතේ මිල රුපියල් 50ක් බවට ඔහු මට පැවසුවේය. එවිට; මම ඉතා දුප්පත් පවුලකින් පැමිණෙන කෙනෙක් බවත් මා රජයේ දෙපාර්තමේන්තුවක රැකියාවක් කරගෙන යන බවත් සාමාන්‍ය මාසික වැටුපක් ලබන කෙනෙක් බවත් පැවසුවෙමි. මගේ තත්ත්වය ගැන අසා ඔහු මට නොමිලේ පොත් දහයක් ලබා දුන්නේය.

එහෙත් ඒ තුළින් මා සෑහීමට පත් නොවුනෙමි. ශාලාව තුළ ගොඩගසා තිබූ බොහෝ පොත් දෙස ජනේලය හරහා බලා සිටීමට මම පෙළඹුණෙමි. ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දැනුම අවශ්‍ය වුවන්ගේ අතට එම පොත් පත් ළඟා කර දෙන ලෙස ඉල්ලා සිටිමින්, ඒවා මා අමතනවාක් මෙන් මට හැඟුණි; එතැනින් පිටව යාමට මට නොහැකි විය.

ටික වේලාවකට පසු තවත් මහත්මයෙක් මා ළඟට පැමිණ මෙසේ ඇසුවේය; "ඔබ කවුද? මෙච්චර වේලාවක් මෙහි සිට අපගේ කාර්යාලය දෙස බලා සිටියේ ඇයි?" එවිට මම කතාකර; මම ජීවමාන දෙවියන් වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට සේවය කිරීමට මහත් ආශාවක් ඇති නිමිත වත්කම් ප්‍රමාණයක් ඇති මනුෂ්‍යයකු බවත් මට තවත් තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලා පොත් ලබා ගැනීමට අවශ්‍ය බවත් මම ඔහුට පැහැදිලි කරමි. ඒවා ලබා ගැනීමට අවශ්‍ය මුදල් නොමැති නොවෙන් මට ඒවා මිලදී ගත හැකි බව ඔහු මට පැවසුවේය.

එම මොහොතේදී මා ඉතා දුෂ්කර තීරණයක් ගත්තෙමි. මගේ එකම වත්කම සහ ප්‍රවාහන මාධ්‍ය වූ මගේ පැරණි බයිසිකලය විකිණීමට මා තීරණය කර ගත්තෙමි. මම වහාම අසල තිබුණු බයිසිකල් අලුත්වැඩියා කරන කඩයකට ගොස් මගේ බයිසිකලය රුපියල් සියයක මුදලකට විකුණුවෙමි. පසුව පැමිණ මා තැපැල්

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR -** Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Youth Meeting : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 1.00 p.m. Sunday**
19. **Telugu Service : 4.00 p.m. Sunday**
20. **Hindi Service : 5.00 p.m. Sunday**
21. **Tamil & English Service : 6.00 p.m. Sunday**
22. Feedback Time : 7.30 p.m. Sunday
23. Women's Prayer : 5.30 p.m. Wednesday
24. Hindi Prayer : 7.00 p.m. Wednesday
25. Men's Prayer : 7.30 p.m. Friday
26. Discipleship Meeting : 6.00 p.m. Saturday
27. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
28. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
29. Ministers' Meeting : 5.30 p.m. First Saturday
30. Parents' Prayer : 4.00 p.m. First Sunday
31. Night Prayer : 9.30 p.m. Third Friday
32. Fasting Prayer : 9:30 a.m. Second Saturday
33. Holy Communion : Second Sunday Service
34. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
35. Staff Devotion : 9.00 a.m. daily
36. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)



මාර්ගික බයිබල් පාඩම් මාලා පොත් දෙසීයක් මිලදී ගත්තෙමි. මගේ එකම ගමන් මාර්ගය අතැර මම පොත් මිටිය කරේ සහ හිසෙහි තබාගෙන Thousand Lights හි සිට කිලෝමීටර් පහක් පමණ ඇවිදගෙන මගේ ගෙදරට පැමිණියෙමි. එතරම් බරක් උසුලාගෙන යාමට පුරුදු නොවූ මම ඉක්මනින්ම වෙහෙසට පත් වූනෙමි. අවස්ථා දෙකකදීම පොත් මගේ උරහිසෙන් ලිස්සා ගොස් පාරට වැටුණේය. මා මෙසේ ගමන් කරන අතරතුර සමහර අය මට සමච්චල් කළ නිසා මා හට අසරණ බවක් සහ



නින්දාවක් දැනුණි. කෙසේ වෙතත්, දෙවියන් වහන්සේගේ කරුණාවෙන් මා ආරක්ෂිතව නිවසට පැමිණ මගේ මුළු සක්තියෙන් පොත් බෙදා හැරීමට පටන් ගත්තෙමි.

අභාවප්‍රාප්ත සහෝදරය එම්.පෝල් රාජ්ගේ උපකාරයෙන් දෙවියන්වහන්සේ මා හට 'ඔබට නව ජීවිතයක්'' යන නමින් හැපැල් මාර්ගික බයිබල්

Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

පාඨමාලාව ආරම්භ කිරීමට හැකියාව ලබා දුන්නේය. පසුව අප ඔහුගේ කැඳවීමේ ප්‍රතිරාවය සත්ධා බයිබල් විද්‍යාලය ස්ථාපිත කෙරුවෙමි.

ඔව්, මගේ ආදරණීය මිතුය, දෙවියන් වහන්සේගේ රාජ්‍යය වෙනුවෙන් මගේ පැරණි බයිසිකලය අත්හැරීමට සිදුවූ කාලයක් මට තිබුණි. මගේ පවුලේ අය සහ මිතුරන් එය මෝඩකමක් සහ නොදැනුවත් කමක් ලෙස සැලකුවෙමි . නමුත් මා ඒ තීරණය ගත් නිසා මට මහත් ලැජ්ජාවකට පත්වීමට සිදුවිය. එහෙත් අදටත් දෙවියන් වහන්සේ මට වාහන සහ මගේ දේව සේවයට සහාය වීමට විශ්වාසවන්ත සහායකයන් ලබා දී තිබේ.

පුද්ගලික ලෙස ශුභාරංචි පත්‍රිකා මගේ උරහිස සහ හිසමත තබාගෙන ගමන් කළ කාලයක් තිබුණි. මගේ තරුණ කාලයේ එය වේදනාකාරී හා නින්දිත අත්දැකීමක් වූ නමුත් අද දෙවියන් වහන්සේ මට ශුභාරංචියට අවශ්‍ය ද්‍රව්‍ය සහ දේව සේවකයින් රැගෙනයාමට සහ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය කාර් සහ කුඩා බස් රථ සපයා දී ඇත.

ආදරණීය මිතුය ඔබගේ ජීවිතය සහ ඔබගේ අනාගතයේ සඳහා දෙවියන් වහන්සේට අද්විතීය සැලැස්මක් ඇත. ඔබට තවමත් කාලය තිබේ. ඔබ ස්වාමීන්වහන්සේට උන්වහන්සේගේ රාජ්‍යය සඳහා භාරදෙන ඕනම දෙයක් කිසිදා නිශ්ඵල නොවේ.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේව ඔබේ ආදර්ශයට ගෙන දේව රාජ්‍යයේ කේන්ද්‍රීය දැක්මක් සහිතව උන්වහන්සේගේ දේව සේවයේ වටිනා දෙයක් ආයෝජනය කරන්න. ඔබේ ජීවිතයට දෙවියන් වහන්සේගේ ආශිර්වාද නිමක් නැත.

මතක තබාගන්න:

තිබෙන්නේ එකම ජීවිතයක්ය;
එය ඉක්මනින් පහව් යනු ඇත;
යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන්
කරන ලද දේ පමණක් පවතිනු ඇත!

*************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS Patrika Channel"**
**on 3rd AUGUST 2026.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**